# රුහුණ විශ්වවිද්‍යාලය
## 2015/2016 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි - 2000 ස්ථලය
## දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු

## SOC 22513/SOC 2205 - සමකාලීන සමාජ සංස්ථා

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

(අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කෙරේ.)

**කාලය : පැය 03 යි.**

---

01. සමාජ සංස්ථා යනු කුමක්ද යි අර්ථ දක්වා, එමඟින් ඉටුවන කෘත්‍යයන් නිසි ලෙස ඉටු නොවීමෙහි ප්‍රතිඵල කවරේදැ යි ඔබ කැමති සමාජ සංස්ථාවක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

02. පවුල් සංස්ථාව මඟින් ඉටුකෙරෙන කෘත්‍යයන් පිළිබඳ සමාජ විද්‍යාත්මක විවරණයක් සපයන්න.

03. "ඥාතිත්වය යන සංකල්පයෙන් පුද්ගලයාගේ ජීව විද්‍යාත්මක සම්බන්ධතාව මෙන් ම සමාජ සම්බන්ධතා ජාලය ද ප්‍රකාශනය වේ." පැහැදිලි කරන්න.

04. විවාහයේ කෘත්‍යයන් පැහැදිලි කරමින් විවාහ රටාවන් පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න.

05. ප්‍රභූ සංසරණය පිළිබඳ දේශීය අධ්‍යයනයන්හි දී සම්භාව්‍ය න්‍යායවාදීන් බලපා ඇති ආකාරය පරීක්ෂා කරන්න.

06. "කුල ක්‍රමය වනාහි දකුණු ආසියාතික සමාජවලට සුවිශේෂී වූ සමාජ සංස්ථාවකි." කුල ක්‍රමය හා පන්ති ක්‍රමය අතර වෙනස සැලකිල්ලට ගනිමින් ඉහත ප්‍රකාශය විමසීමට ලක් කරන්න.

07. නිලබල ක්‍රමය පිළිබඳ පරමාදර්ශය දක්වා, ශ්‍රී ලාංකීය සමාජය තුළ එය ක්‍රියාත්මක වන අයුරු උදාහරණ සහිත ව පෙන්වා දෙන්න.

08. පහත සංකල්ප අතරින් දෙකක් (02) විචාරාත්මක ව විග්‍රහ කරන්න.

    (i) ගෝලීයකරණයේ ප්‍රතිවිපාක
    (ii) ව්‍යභිචාරය හා සුලෝහිතතාව
    (iii) ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ශ්‍රම විභජනය
    (iv) ශ්‍රී ලංකාවේ ද්විතියික අධ්‍යාපනය

@@@@@@@@@

125